# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

# ඇබෑර්තු

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා යෝග්‍ය සුදුසකම් සහිත පුද්ගලයන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1) වෛද්‍ය නිලධාරී**

**වැටුප් පරිමාව :** මාසිකව 55,350–10x1,335:1x1,630-70,330 [U-MO 1 (II)]

**සුදුසුකම්**

පිළිගත් විශ්වවිද්‍යාලයක වෛද්‍ය උපාධිය සමග වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්ද

**සටහන :**

1. අයදුම්කරු වෛද්‍ය වෘත්තිකයකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී සිටිය යුතුය.
2, තෝරාගත් අයදුම්කරුට, නවාතැන් පහසුකම් සැපයීම සලකා බැලේ.
3. ඉහත තනතුර දරන තැනැත්තා පත්වීම ස්ථිර කිරීමෙන් පසු අනුමත විධිවිධාන අනුව සප්ත වාර්ෂික නිවාඩු සඳහා සුදුසුකම් ලබයි.
4. රජයේ/ සංස්ථාවල සේවයේ නියුතු වෛද්‍ය වෘත්තිකයන් සහ දැනට රාජ්‍ය අංශයේ සේවයේ නියුතු වෛද්‍ය වෘතිතිකයන් තෝරා ගැනීම මත නිදහස් කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ අදාළ සංස්ථාව හරහා ලබා ගැනීම අවශ්‍යවේ.
5. අනුමත විධිවිධාන ප්‍රකාරව පර්යේෂණ දීමනාව (මූලික වැටුපෙන් 35%) ගෙවීම සලකා බලනු ලැබේ.

**වයස් සීමාව :** වයස් සීමාව අදාළ නොවේ. විශ්වවිද්‍යාල සේවකයකුගේ අනිවාර්යය විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු හැට වේ. තෝරාගත් අපේක්ෂකයා රාජකාරී භාරගත් දිනයේ සිට ගණනය කරනු ලබන වසර තුනක හෝ එක් වසරක (විශ්වවිද්‍යාල පද්ධතියේ ස්ථිර කරන ලද සේවකයන් සඳහා) පරිවාස කාලයකට යටත් වේ.

**2) ගොවිපොළ කළමනාකරු III ශ්‍රේණීය**

**වැටුප් පරිමාව :** මාසිකව 50,625- 3x1,125-54000(EB) 55335:12X1335-71355 [U-EX I (II)]

**සුදුසුකම්**

පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ HEI වෙතින් කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් තිබීම සමග උපාධිය ලැබීමෙන් පසු පිළිගත් ආයතනයක භෝග, පශු පාලනය සහ / හෝ සත්ත්ව විද්‍යාව පිළිබඳ වසර දෙකකට (02) නොඅඩු ක්ෂේත්‍ර පළපුරුද්දක් තිබිය යුතුය.

**වයස් සීමාව :** වයස් සීමාව අදාළ නොවේ. විශ්වවිද්‍යාල සේවකයකුගේ අනිවාර්යය විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු හැට වේ. තෝරාගත් අපේක්ෂකයා රාජකාරී භාරගත් දිනයේ සිට ගණනය කරනු ලබන වසර තුනක හෝ එක වසරක (විශ්වවිද්‍යාල පද්ධතියේ ස්ථිර කරන ලද සේවකයන් සඳහා) පරිවාස කාලයකට යටත් වේ.

**3) තාක්ෂණ නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණීය**

**වැටුප් පරිමාව :** රු. 31,625-7x300;10x355-37,275 U-MT I (III)

**සුදුසුකම්**

(i) අ.පො.ස (උ/පෙළ) විභාගය භෞතික විද්‍යා ධාරාවෙන් එකවර විෂයන් තුනක් (3) සමත් වී තිබීම.

**සහ**

(ii) තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තිය පුහුණු ආයතනයකින් හෝ යාන්ත්‍රික ඉංජිනේරු/ හෝ සමාන ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද N.V.Q. 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම.

**වයස් සීමාව :** අයදුම්පත් අවසන් කරන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**4) තාක්ෂණ නිලධාරී (රසායන ද්‍රව්‍ය) III ශ්‍රේණීය**

**වැටුප් පරිමාව :** රු. 31,625-7x300:10x335-37,275 U-MT I (III)

**සුදුසුකම් :**

(i) අ.පො.ස (උ/පෙළ) විභාගය විද්‍යා විෂය ධාරාවෙන් එකවර විෂයන් තුනක් (3) සමත් වී තිබීම

**සහ**

(ii) (අ) වෛද්‍ය රසායනාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක්

**හෝ**

(ආ) තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණ/ වෘත්තිය පුහුණු ආයතනයකින් හෝ රසායන විද්‍යා/ රසායන ඉංජිනේරු ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක් මගින් නිකුත් කරණ ලද N.V.Q. 5 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සැළකිය යුතුයි :** ඉහත (ii) (ආ) හි සඳහන් සුදුසුකම් පිළිගත හැකි බව අදාළ පීඨය විසින් තීරණය කරනු ලැබේ.

**වයස් සීමාව :** අයදුම්පත් අවසන් කරන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**5) වැඩහල් අධිකාරී II ශ්‍රේණීය (ඉංජිනේරු වැඩහල)**

**වැටුප් පරිමාව :** රු. 37,275-18x495-46,185 [U-MN 2(II)]

**සුදුසුකම් :**

1. (අ) ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව හෝ සමාන සුදුසකමක් සමග එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්දක් තිබීම.

**සැලකිය යුතුයි :** වසර 04ක පළපුරුද්ද සඳහා යන්ත්‍රාගාර තුළ පුහුණු කාලය ගණනය නොකෙරේ.

**හෝ**

(ආ) ජාතික තාක්ෂණික සහතිකය හෝ සමාන සුදුසුකමක් සමග එම සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයෙහි අවම වශයෙන් වසර දහයක (10) පළපුරද්ද

**වයස් සීමාව** : අයදුම්පත් අවසන් කරන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

එක් එක් කරුණ යටතේ දක්වන ලද වැටුපට අතිරේකව පහත සඳහන් දීමනා ද ගෙවන බව කරුණාවෙන් සලකන්න.

i. ජීවන අංක දීමනාව – රු. 17,800/-
ii. අතිරේක දීමනාව – මූලික වැටුපෙන් 20%
iii. මාසික සංතෝලන දීමනාව (MCA)– මූලික වැටුපෙන් 45%
iv. 5,000/– දීමනාව

**පොදු සටහන් :**

i, පවතින නියමයන්ට සහ රෙගුලාසීන්ට අනුව අයදුම්පත කෙටි ලැයිස්තුගත කිරීමේ සහ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.

ii. රජයේ / සංස්ථා සේවකයින් තම අයදුම්පත් සහතික කරන ලද වර්තමාන වැටුප් විස්තර වාර්තාවක් සමඟ අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා ප්‍රධානියා හරහා ඉදිරිපත් කළ යුතුය. අවසන් කරන දින හෝ ඊට පෙර නිසි මාර්ගයකින් නොලැබෙන අයදුම්පත් සලකා නොබැලේ.

iii. තෝරාගනු ලබන අයදුම්කරුවන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට මෙන්ම විශ්වවිද්‍යාල විශ්‍රාම යෝජනා ක්‍රමයට දායක කරගනු ලැබේ. අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය 10% ක් වන අතර, සේවායෝජකයා විසින් පිළිවලින් 7% ක් සහ 8% ක් අර්ථ සාධක අරමුදලට සහ විශ්‍රාම අරමුදලට දායකකරනු ලැබේ. තවද සේවායෝජකයා විසින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත 3%ක් දායක කරනු ලැබේ.

iv. අයදුම්පත් විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන **http://www.pdn.ac.lk/vacancies**/ වෙතින් භාගත කරගත යුතු අතර, යථාපරිදි සම්පූර්ණ කරණ ලද අයදුම්පත් සුදුසුකම් සහ පළපරුද්ද/ සේවය සනාථ කිරීමේ සහතිකයන්හි ජායා පිටපත් සමග 2025.01.20 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් නියෝජ්‍ය ලේඛකාධිකාරී අනධ්‍යන ආයතන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත එවිය යුතුය.

v. කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි, අයදුම් කරන තනතුරෙහි නම සඳහන් කළ යුතුය.

vi. අයදුම්පත් පෞද්ගලිකව භාර නොගන්නා අතර, එවැනි ඉදිරිපත් කිරීම් පිළිබඳ කිසිදු වගකීමක් විශ්වවිද්‍යාලය නොදරයි. අසම්පූර්ණ අපැහැදිලි ප්‍රමාද වී ලැබෙන සනාථ ලිපිලේඛන රහිත සහ දක්වා ඇති ආකෘතිපත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

vii. පහත සැබැඳිය ඔස්සේ විශ්වවිද්‍යාල පද්ධතිය, පරිපාලනය සහ මූල්‍ය පටිපාටිය ආදිය පිළිබඳ තොරතුරු ලබාගත හැක. **https://www.pdn.ac.lk**

**වැඩබලන ලේඛකාධිකාරී,**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය.**